## 14. විපාක ප්‍රත්‍යයේ ත්‍රිරාශිය

ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ විපාක ප්‍රත්‍ය ධර්මයෝ ය.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍ය ලබන විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය යන නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවනු ලබන විඥප්ති රූප වර්ජිත චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ය.

කුසල් සිත් එක්විස්ස ය, අකුසල් සිත් දොළොස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික දෙපණස ය යන නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවනු ලබන චිත්තජ රූපයෝ ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය, අසංඥ සත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු විපාක ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**විපාක පච්චයො -** විපාකයෙහි ස්වභාවය කලින් දැක්වූ චේතනා සඞ්ඛ්‍යාත කර්මයේ ස්වභාවයට ප්‍රතිවිරුද්ධ ය. කුසල අකුසල ජවනයන්ට පසුව ඵලයන් ගෙනදීම සඳහා මේ මොහොතේ කාය, වාක්, චිත්ත යන ක්‍රියාවන් ඇති කරවීම සඳහා ව්‍යාපාර ඇත්තේය. විපාක සිත් වනාහි කුසල අකුසල කර්මයන්ගේ හේතුවෙන් අනුරූප ඵලයන් ඇති කරන බැවින් එබඳු ව්‍යාපාර ශක්තියක් නැත. එබැවින් කුසල අකුසල ජවනයන් පහළ වන අවස්ථාවේ දී ශාන්ත භාවයක් නොමැතිව දියුණුව කැමැති වන්නා පුද්ගලයෙකු විසින් කරනු ලබන උත්සාහයකට සමාන වේ. විපාක සිත් පහළ වන අවස්ථාව ගුරු, දෙමව්පියන්ගේ ආභාෂය නිසා ශාන්තව වැඩෙන දරුවෙකුගේ උපමාවෙන් සහ දියුණු වීමට උත්සාහ නොකරන පුද්ගලයෙකුගේ උපමාවෙන් වටහා ගත හැකිය.

මෙම විපාකය සිත්වල ශාන්ත භාවයෙන් යුතුව පවතින ආකාරය ද තද නින්දට වැටුණු කාලය පිළිබඳව සලකා බැලීමේදී ප්‍රකට වේ. නිවැරදිය - තද නින්දට වැටුණු විට භවාංග නම් වූ විපාක සන්තතිය උපදියි. ඒ විපාක සිත් උපදින ආකාරය සිතින් දත නොහැකි තරමට ශාන්ත වේ. තද නින්දෙහි සිටින විට දී කිසිදු කාය, වාක්, චිත්ත ප්‍රයෝගයක් සිදු නො කෙරේ. පඤ්චද්වාරික සිත්වල ද ද්විපඤ්ච

විඤ්ඤාණ, සම්පටිච්ඡන ආදී විපාක සිත් ද ඇති වන ආකාරය නිවැරදි පරිදි ප්‍රකට කරගත හැක්කේ නො වේ. ජවනයන් ඇරඹුණු විට ම ඒ පඤ්චද්වාරික වීථි ප්‍රකට වේ. මේ ආකාර ඇත්තා වූ විපාක සිත් ව්‍යාපාරයන්ගෙන් වෙන්ව ඇති බැවින් ශාන්ත වන්නා වූ ධර්මයෝ වෙත්.

එබැවින් "ශාන්ත පැවතුම් ඇති පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකුට ශාන්තව ජීවත්වීම සඳහා කටයුතු කරන්නාක් මෙන් ස්වකීය ව්‍යාපාර ප්‍රයෝගයන් විරහිත වීමෙන් ශාන්ත වෙමින් තමා හා උපදින ධර්මයන්ට ද ව්‍යාපාර ප්‍රයෝගයන්ගෙන් මුක්තව ශාන්තව පැවතීම පිණිස ප්‍රත්‍යය වන්නා වූ ශක්තිය විපාක ශක්තිය යැයි දත යුතු වේ"

පට්ඨාන අටුවාව - නිරුස්සාහසන්තභාවෙන නිරුස්සාහසන්තභාවාය උපකාරකො විපාකධම්මො විපාකපච්චයො.

"නිරුස්සාහසන්තභාවෙන - ව්‍යාපාර නොමැති ශාන්ත භාවයෙන්, නිරුස්සාහසන්තභාවාය - ව්‍යාපාර නොමැති ශාන්ත භාවය පිණිස" යැයි අර්ථ ගත යුතු වේ. මෙහි "සන්ත" සඳහා දී ඇති 'ශාන්ත' යන වචනය ක්ලේශයන් නිසා උපදින දහයෙන් ශාන්ත බවට පැමිණීමක් නො වේ. ප්‍රයෝග ව්‍යාපාරයන්ගෙන් වෙන් වුණු ශාන්ත භාවයකි යැයි අවබෝධ කරවීමට "නිරුස්සාහෙන" යන විශේෂණ පදය ඇතුළත් කොට ඇත. එබැවින් 'නිරුස්සාහ' යනු සන්තභාවයේ විශේෂණ පදය යි. "උස්සාහ" සඳහා විරිය නොගත යුතුය. ව්‍යාපාරය ගත යුතු වේ.

අනුටීකා - තෙන සඋස්සහොති ච ක්‍රියාමයචිත්තුප්පාදස්ස පවත්තිආකාරො වෙදිතබ්බො. යො බ්‍යාපාරොති වුච්චති න වීරියුස්සාහො.

**ප්‍රත්‍යය** - "ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන" යන්නෙහි අදහස සහජාත ප්‍රත්‍යයේ දී දැක්වූ ආකාරයෙන් ගත යුතු වේ.

**ප්‍රත්‍යයෝත්පන්න** - "ඒ නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන විඥප්ති රූප වර්ජිත" යන්නෙහි 'සුදුසු පරිදි' යැයි පැමිණේ. ඒ සඳහා ස්වරූපාර්ථ ගැනීමේ දී විපාක සිත් අතරින් අරූප විපාක සිත් ද ද්විපඤ්ච විඤ්ඤාණයන් ද අරූප භවයේ දී උපදින අවස්ථාවේ දී ඵල සිත් සතර ද රූප පහළ නොකරවන බව සැලකිය යුතුය. එබැවින් 'සුදුසු පරිදි' යැයි දැක්වීය. විපාක නාමස්කන්ධයන්ට (රූප පරිච්ඡේදයේ දී දැක්වූ ආකාරයට) විඥප්ති රූප පහළ කරවීමට

නොහැකි බැවින් "විඥප්ති රූප වර්ජිත" යැයි දක්වීය. ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්නයන්ගේ පහළ වීම සහජාත ප්‍රත්‍යයේ දී දක්වූ ක්‍රමය අනුසාරයෙන් දත යුතු වේ.

**"බන්ධා" යන පදය භාවිත කිරීම** - සිත් සහ චෛතසිකයන් ඔවුනොවුනට ප්‍රත්‍යය වීම දක්වීමේ දී "එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා" ආදී වශයෙන් පාළියෙහි දක්වේ. එබැවින් සිත් සහ චෛතසිකයන් ඔවුනොවුනට ප්‍රත්‍යය වන්නා වූ සහජාතාදී ප්‍රත්‍යයන්හි දී ප්‍රත්‍ය සහ ප්‍රත්‍යෝත්පන්නයන් සඳහා "ඛන්ධා" යන වචනය වදාළහ. ඒ ආකාරයට චෛතසික ධර්මයන් ඔවුනොවුනට ප්‍රත්‍යය නොවන්නා වූ ප්‍රත්‍යයන්හි "ඛන්ධා" යන ව්‍යවහාරය නැත.

**ප්‍රත්‍යනීක** - "ඒ නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන" යන වාක්‍ය ඛණ්ඩය 'චිත්තජ රූපයෝ ය' යන්නෙහි සම්බන්ධ කරන්න. ඒ නාමස්කන්ධයන්ගෙන් සුදුසු පරිදි උපකාරය ලබන, උපදවන ලද චිත්තජ රූපයෝ ය යැයි අදහස් වේ. මෙහි චිත්තජ රූපයන්හි විඤ්ඤත්ති රූප ද ඇතුළත් වේ. 'සුදුසු පරිදි' යන්නෙන් අභිඥා හැර අර්පණා ජවන් විඤ්ඤත්ති පහළ කරවීමට නොහැකි බව දත යුතු වේ. තවද "වොට්ඨබ්බනා කාමාවචරජවනාභිඤ්ඤා පන විඤ්ඤත්තිම්පි සමුට්ඨාපෙති" යැයි පැමිණෙන නිසා විඤ්ඤත්ති උපදවන්නා වූ සිත් ගැන ද අවධානය යොමු කළ යුතු වේ.